**14-02-2026 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ වඩාත්ම උසස්, වඩාත්ම භාග්‍යවන්ත, බ්‍රහ්මණ වංශයේ සැරසිල්ලයි. පරමාත්ම දෙවියන්ම ඔබට සුබ පැතුම් ලබා දෙයි.

**ප්‍රශ්නය:** පියා ඔය දරුවන්ට ස්වර්ණමය යුගයේ නොව, සංගම යුගයේදී, ලෝකයේ පුවත් ලබා දෙන්නේ ඇයි?

**පිළිතුර:** ස්වර්ණමය යුගය, ආරම්භක කාලයයි. මුළු ලෝකයේම පුවත් එනම්, ලෝකයේ මුල, මැද සහ අවසානය පිළිබඳ දැනුම ඔහු ඔබට එකල පවසන්නේ කෙසේද? චක්‍රය, නැවත සිදු වී නොමැති නම්, ඔහු ඔබට චක්‍රය පිළිබඳ පුවත් දෙන්නේ කෙසේද? පියා විසින් ඔය දරුවන්ට සම්පූර්ණ පුවත් ලබා දෙන්නේ, සංගම යුගයේදීය. ඥානයේ තෙවැනි ඇසක් ලබාගන්නා අය වන්නේද ඔබලාය.

ඕම් ශාන්ති. අද, ත්‍රිමූර්ති ශිවාගේ උපන් දිනය වන ශුභ දිනයයි, එබැවින් ඔය සියලුම බ්‍රහ්මණයන්ගේ මෙන්ම සංගම යුගයේද උපන්දිනයයි. බාබාට, මෙම දේවමය උපත් අයිතියට, සුබ පැතුම් ලබා දිය නොහැකි අය බොහෝ සිටියි. ශිව බාබාව, හෝ ඔබට ඔහුගෙන් ලැබෙන්නේ කුමක්ද කියා නොදන්න, බොහෝ දෙනෙක් සිටියි. මෙම සුබ පැතුම් ගැන ඔවුන්ට කුමක් වැටහෙයිද? අළුත් දරුවන්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත. මෙය දැනුමේ නර්තනයයි. ක්‍රිෂ්ණා නර්තනය කළ බව කියයි. මෙහි, දරුවන්, රාධේ සහ ක්‍රිෂ්ණා මෙන් ඇඳගෙන නර්තනය කරයි. කෙසේවෙතත්, නර්තනයක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. ස්වර්ණමය යුගයේදී, ඔහුගේ ළමා කාලයේදී, ඔහු රාජ කුමර කුමරියන් සමඟ නර්තනය කරයි. මේ බාප්දාදා බව, ඔය දරුවන්ට වැටහෙයි. දාදාට, සීයා යැයි කියයි. මෙම දාදා, භෞතික පියෙකි. මෙය ආශ්චර්යමත් කරුණකි! එම දාදා ආධ්‍යාත්මික වන අතර, මෙම කෙනා (බ්‍රහ්ම බාබා) භෞතිකයි. අපට බාප්දාදා යැයි කියයි. ඔබට සීයාගේ උරුමය, පියා මඟින් ලැබෙයි. උරුමය ලැබෙන්නේ සීයාගෙනි. සියලුම ජීවාත්ම, සහෝදරයන්ය. ඔබට උරුමය ලැබෙන්නේ පියාගෙනි. පියා පවසන්නේ ඔය ජීවයන්ට, ඔබගේම සිරුරු සහ භෞතික ඉන්ද්‍රියන් තිබේ. මට අශාරීරික කෙනා යැයි කියයි. එබැවින් මට අනිවාර්යෙන්ම ශරීරයක් අවශ්‍යයි, එවිට පමණයි මට ඔය දරුවන්ට රාජයෝගාව උගන්වා, ඔබට මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට, සහ අපවිත්‍ර බවින් පිවිතුරු බවට පත් වන අන්දම පෙන්වා දිය හැකි වන්නේ. මා අපිරිසිඳු ඇඳුම් සෝදනවා. ඔහු නිසැකයෙන්ම විශිෂ්ඨ රෙදි අපුල්ලන්නෙකි. ඔහු සියලුම ජීවාත්ම සහ මුළු ලෝකයේම සිරුරු සෝදයි. ඔය ජීවාත්ම, දැනුම සහ යෝගාවෙන් සේදෙයි. අද මෙහි පැමිණ සිටින ඔය දරුවන්ට වැටහෙනවා, ඔබ පැමිණියේ ශිව බාබාට සුබ පැතුම් ලබා දෙන්නට බව. පියා පවසන්නේ ඔබ සුබ පැතුම් ලබා දෙන්නට කියා පැමිණි පියාම, ඔබට සුබ පැතුම් ලබා දෙනවා, මන්ද වඩාත්ම උසස්, වඩාත්ම භාග්‍යවන්ත බ්‍රහ්මණ වංශයේ සැරසිල්ල වන්නේ ඔබ නිසා. දේවතාවන්, ඔබ තරම් ශ්‍රේෂ්ඨ නැත. බ්‍රහ්මණයන්, දේවතාවන්ටත් වඩා ඉහළයි. උසස්ම උසස් වන්නේ පරමාත්ම පියාය. ඔහු ඉන්පසුව බ්‍රහ්මගේ ශරීරය තුළට ඇතුළු වෙයි. ඔහුගේ දරුවන් වන ඔබලා, ඉන්පසුව උසස්ම-උසස් බ්‍රහ්මණයන් වෙයි. මුදුන් මල්කඩ වන්නේ බ්‍රහ්මණයන්ය. දේවතාවන් සිටින්නේ ඔවුන්ට පහළින්ය. ඉහළින්ම සිටින්නේ ශිව බාබාය. බාබා ඔය දරුවන්ව බ්‍රහ්මණයන් බවට පත් කර තිබෙන්නේ, ඔබට ඔබගේ දිව්‍ය ලෝකයේ උරුමය ලබා දීමටයි. බලන්න, මිනිසුන් ලක්ෂ්මී සහ නාරායනට කෙතරම් දේවාල තනා තිබේද කියා! ඔවුන් ඉදිරියේ ඔවුන් වැඳ වැටෙයි. දේවතාවන්ද මනුෂ්‍යයන් බව, භාරතයේ ජනයා වටහාගත යුතුයි. ලක්ෂ්මී සහ නාරායන එකිනෙකාගෙන් වෙන් වූ දෙදෙනෙකි. මෙහි එක් පුද්ගලයෙකුට දෙදෙනාගේම නම තිබේ. එක් පුද්ගලයෙක් තමන්ට ලක්ෂ්මී-නාරායන යන නම කියාගනී, එනම්, ඔහු තමන්ට අත් සතරේ ප්‍රතිරූපය වන විෂ්ණු යන නම තබාගැනීමයි. ඔවුන් තමන්ට ලක්ෂ්මී-නාරායන හෝ රාධේ-ක්‍රිෂ්ණා යන නම් දීගෙන තිබේ, එබැවින් මින් කියැවෙන්නේ ඔවුන් අත් සතරක පිළිරූ වී ඇති බවයි. සූක්ෂම දේශයේ එම විෂ්ණු, අරමුණ සහ ඉලක්කයයි. ඔබ එම විෂ්ණු දේශයේ අධිපතියන් වෙයි. ලක්ෂ්මී සහ නාරායන, විෂ්නු දේශයේ අධිපතියන්ය. විෂ්ණුට අත් සතරකි ලක්ෂ්මීගේ දෙකක් සහ නාරායනගේ දෙකකි. ඔබ පවසන්නේ, ඔබ විෂ්ණු දේශයේ අධිපතියන් වන බවයි. අච්චා, පියාගේ ප්‍රශංසා ගීයක් ගයන්න! ආරම්භයේ සිට මේ දක්වා, මුළු ලෝකය පුරාම ඒකායන ඔහුගේ හැර, වෙනත් කිසිවෙකුගේ ප්‍රශංසාවක් නොමැත. සෑම දෙයක්ම අංක පිළිවෙලයි විශිෂ්ඨතම සහ උසස්ම ප්‍රශංසාව, උසස්ම-උසස් උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මයගේය. ඔබලා ඔහුගේ දරුවන්ය. ඔබ පවසන්නේ අපි පරමාත්ම දෙවියන්ගේ දරුවන්ය. පරමාත්ම දෙවියන්, දිව්‍ය

ලෝකයේ නිර්මාණකරුයි, එබැවින් ඔබ තවමත් අපායේ ඉඳගෙන සිටින්නේ ඇයි? පරමාත්ම දෙවියන් උපත ලබන්නේ මෙහිය. ක්‍රිස්තියානුවන් කියන්නේ, ඔවුන් අයත් වන්නේ ක්‍රිස්තු තුමාට බවයි. ඔවුන් උත්තරීතර පියාගේ, උත්තරීතර ජීවයේ ඍජු දරුවන් බව, භාරතයේ ජනයාට අමතක වී ඇත. පියා මෙහි පැමිණෙන්නේ, ඔය දරුවන්ව ඔහු සතු කරගැනීමට සහ රාජධානියේ ඔබගේ භාග්‍යය ඔබට ලබා දීමටයි. බොහෝ අළුත් දරුවන් පැමිණ ඇති බැවින්, අද බාබා සෑම දෙයක්ම ඉතා පැහැදිලිව විස්තර කර දෙනවා. ඔවුන්ට වටහාගැනීමට අපහසු වුවත්, ඒ වුවද ඔවුන් දිව්‍ය ලෝකයේ වැසියන් වෙයි. ස්වර්ණමය යුගයේ, සූර්ය රජ පෙළපතේ රජ සහ රැජිණ, සේවිකාවන් සහ දාසයන් මෙන්ම පුරවැසියන්ද සිටියි. ඔවුන්ගෙන් ඇතමෙක් ධනවත් වන අතර ඇතමෙක් දුප්පත්ය. ඔවුන්ටද සේවකයන් සහ දාසයන් සිටිනවා. මුළු රාජධානියම ස්ථාපිත වන්නේ මෙහිය. වෙනත් කිසිවෙක් මෙය නොදනී. සියලුම ජීවාත්ම තමෝප්‍රධාන්ය. දැනුමේ තෙවැනි ඇස, කිසිවෙකුට නොමැත. (ගීතයක් වාදනය කරන ලදී). ගීතයෙන් ඔබ පරමාත්ම පියාගේ ප්‍රශංසාවට සවන් දුන්නා. ඔහු සියල්ලන්ගේම පියාය. පරමාත්ම දෙවියන්ට, පියා යැයි කියයි අනන්ත සතුට දෙන පියා. අනන්ත සතුට තිබුණු භාරතය මෙයයි, එය ලක්ෂ්මී සහ නාරායනගේ රාජධානිය විය. ලක්ෂ්මී සහ නාරායනගේ ළමා කාලයේදී ඔවුන් රාධෙ සහ ක්‍රිෂ්ණා වූ අතර, පසුව ඔවුන්ගේ විවාහයේදී ඔවුන්ට ලක්ෂ්මී සහ නාරායන යන නම් තැබීය. භාරතයේ, වසර 5000 කට පෙර, දේවතාවන්ගේ රාජධානිය විය. වෙනත් කිසිවෙකුගේ රාජධානියක් නොවීය, ලක්ෂ්මී සහ නාරායනගේ පමණයි. වෙනත් මහාද්වීප තිබුණේ නැත. එබැවින් ලක්ෂ්මී සහ නාරායනගේ පෙර උපතෙදී, ඔවුන් කුමනාකාරයේ ක්‍රියාවන් සිදු කළේද කියා, භාරතයේ ජනතාව අනිවාර්යෙන්ම දැන සිටිය යුතුයි. ඔහු මෙතරම් ධනවත් වන්නට, ඔහුගේ පෙර උපතෙදී බිර්ලා කුමන ආකාරයේ ක්‍රියා සිදුකළාද කියා මිනිසුන් විමසයි. ඔහු නිසැකයෙන්ම ඔහුගේ පෙර භවයෙදී බොහෝ දන් දී බොහෝ පුණ්‍යකර්ම සිදු කරන්නට ඇති බව කියයි. සමහරුන්ට බොහෝ ධනය ඇති අතර තවත් සමහරෙක් එවන් ක්‍රියා සිදුකර ඇති බැවින්, ඔවුන්ට කෑමට අවශ්‍ය තරම් වත් නොමැත. සෑම කෙනෙක්ම කර්මය ගැන විශ්වාස කරයි. ගීතාවේ දෙවියන්, කර්ම, අකර්ම සහ පාපකර්ම පිළිබඳ න්‍යාය, විස්තර කර ඇති අතර, ඔබ ඔහුගේ ප්‍රශංසාව අසා තිබේ. ශිව පරමාත්ම දෙවියන් එක්කෙනෙක් පමණයි. මනුෂ්‍යයන්ට දෙවියන් යැයි කිව නොහැක. පියා දැන් පැමිණ ඇත්තේ කොහාටද? මහා භාරත යුද්ධය අත ලඟ බව ඔබ විස්තර කරයි. දුක ඇති කලට සෑම කෙනෙක්ම ඔහුව සිහි කරන බව, සියල්ලන්ටම වඩා මිහිරි බාබා විස්තර කරයි. 'සෑම කෙනෙක්ම දුකේදී දෙවියන් සිහි කරයි...' ඔවුන් දුකින් සිටින විට සෑම කෙනෙක්ම ශිව බාබාව සිහිපත් කරයි. ඔවුන් සතුටින් සිටින විට කිසි කෙනෙක් ඔහුව සිහි නොකරයි. දිව්‍ය ලෝකයේ දුක තිබුණේ නැත. එහි ඔවුන්ට තිබුණේ, පියාගෙන් ඔවුන් ලබා ගත් උරුමයයි. ශිව බාබා, වසර 5000 කට පෙර පැමිණි විට, ඔහු භාරතය, දිව්‍ය ලෝකය බවට පත් කළා. එය දැන් අපායයි. පරම පියා පැමිණ සිටින්නේ දිව්‍ය ලෝකය නිර්මාණය කිරීමටයි. ලෝකයේ කිසිම කෙනෙක් මෙයවත් නොදනී. ඔවුන් පවසන්නේ අප සියල්ලන්ම අන්ධයි! අන්ධයින්ට සැරයටිය වන අහෝ දෙවියනේ, වඩිනු මැනවි! පැමිණ අපට පෙනීම ලබා දෙන්න! ඔය සෑම දරුවෙකුටම දැනුමේ තෙවැනි ඇසක් ලැබී තිබේ. ජීවාත්ම වන අප, වාසය කරන ස්ථානය, සාම දේශයයි. පරමාත්ම පියාද වාසය කරන්නේ එහිය. ජීව වන ඔබ සහ මා එහි වාසය කරනවා. ඔහු මෙම කෙනාගේ සිරුර තුළින් පවසන්නේ ඔය සියලුම ජීවයන්ගේ පියා වන මා, වාසය කරන්නේ එහිය. ඔබ ඔබගේ පුනර්භවයන්ගේ චරිත කොටස් රඟපාන නමුත් මා එසේ කරන්නේ නැත. ඔබ ලෝකයේ අධිපතියන් වනවා මා එය වන්නේ නැත. ඔබ උපත් 84 ක් ගත යුතුයි. ඔබට කියා තිබුණේ අහෝ දරුවනි, ඔබ ඔබගේම උපත් ගැන නොදනී. උපත් මිලියන 8.4 ක් ගැන මිනිසුන් පවසන විට, එය බොරුවක්. මම, දැනුමේ මහා සාගරයයි, පාරිශුද්ධකරුයි. මා පැමිණෙන්නේ සෑම කෙනෙක්ම අපවිත්‍ර වූ විටයි. මා ඔබට ලෝකයේ මුල, මැද සහ අවසානය ගැන රහස් විස්තර කර දී, ඔබව ත්‍රිකාලදර්ශි කරවන්නේ එවිට පමණයි. බොහෝ මිනිසුන් විමසන්නේ මනුෂ්‍යයන් මුලින්ම නිර්මාණය වුණේ කෙසේද? දෙවියන් ලෝකය නිර්මාණය කළේ කෙසේද? එක්තරා ආගමික ග්‍රන්ථයක, සියලුම මනුෂ්‍යයන් මුළුමනින්ම ශූන්‍ය වී ගොස්, ඉන්පසුව ළදරු ක්‍රිෂ්ණා බෝ පත්‍රයක් මත, සාගරයේ පා වෙමින් එන සැටි ඔවුන් පෙන්වයි. පියා පවසන්නේ එවන් කිසි දෙයක් වෙන්නේ නැත. මෙය අසීමිත නාටකයයි. ස්වර්ණමය සහ රිදී යුග, දිවා කල වන අතර, තඹ සහ කලි යුගයන්, රාත්‍රියයි. ඔය දරුවන්, පියාට සුබ පැතුම් ලබා දෙයි. පියා පවසන්නේ ඔබටත් එසේමයි! ඔබ 100% අවාසනාවන්ත කමින්, 100% වාසනාවන්ත වෙයි. ඔබ, එම භාරතයේ ජනයාමයි, නමුත් ඔබ මෙය නොදනී. පියා පැමිණ සිටින්නේ ඔබට මෙය පැවසීමටයි. ඔබ ඔබගේම උපත් පිළිබඳව නොදනී. ඔබ උපත් 84 ක් ගෙන ඇති බව, මා පැමිණ, ඔබට විස්තර කර දෙමි. පියා සංගම යුගයේදී ඔබට මුළු ලෝකයේම පුවත් ලබා දෙයි. ඔහු ඔබට ස්වර්ණමය යුගයේදී මෙය පවසන්නේ නැත. ආරම්භයේ සිට මැද හරහා, අවසානය තෙක් තවමත් නොගිය ලෝකයක් ගැන පුවත්,

ඔහු ඔබට පවසන්නේ කෙසේද? මා පැමිණෙන්නේ කල්ප අවසානයේදී, සංගම යුගයෙදීය. ආගමික පත පොතේ ඔවුන් ලියා ඇත්තේ, මා සෑම යුගයකම පැමිණෙන බවයි. ගීතාවේ කියා තිබෙන්නේ 'ක්‍රිෂ්ණා දෙවියන් පවසයි'. වෙනත් ආගම් වල අය, ක්‍රිෂ්ණා දෙවියන් වන බව විශ්වාස කරන්නේ නැත. දෙවියන් අශාරීරිකයි. ඔහු සියලු ජීවාත්මයන්ගේ පියාය. ඔබට ඔබගේ උරුමය හිමි වන්නේ පරමාත්ම පියාගෙනි. ඔය සියලුම ජීවාත්ම, සහෝදරයන්ය. දෙවියන් සර්ව ව්‍යාප්තික බව පවසන විට, එය පීතෘත්වයක් වෙයි. පියෙකුට උරුමයක් ලැබෙනවාද? උරුමයක් ලැබෙන්නේ දරුවන්ටයි. ඔය සියලුම ජීවාත්ම, දරුවන්ය. ඔබට අනිවාර්යෙන්ම පියාගේ උරුමය අවශ්‍යයි. ඔබ සීමිත උරුමයක් සමඟ සතුටට පත් වන්නේ නැත, ඔබ මෙසේ කන්නලව් කරන්නේ එබැවින්ය ඔබගේ දයාවෙන් අපට බොහෝ සතුට හිමි විය! දැන්, ඔබට රාවණාගෙන් දුක ලැබුණු නිසා, ඔබ නැවතත් කන්නලව් කරන්න පටන් ගත්තා. ඔවුන් සියලු දෙනාම දුකින් සිටින නිසා, සියලුම ජීව කන්නලව් කරයි. ඒ නිසයි ඔවුන් ඔහුව සිහි කර මෙසේ පවසන්නේ බාබා ඇවිත් අපට සතුට ලබා දෙන්න! මෙම දැනුම තුළින් ඔබ දැන් දිව්‍ය ලෝකයේ අධිපතියන් බවට පත් වනවා. ඔබට විමුක්තිය ලැබෙන නිසයි, මෙසේ සිහිකර තිබෙන්නේ සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා වන්නේ එක් පියාය. දැන් සෑම කෙනෙක්ම පහත් තත්ත්වයක සිටින අතර, ඉන්පසුව සෑම කෙනෙකුටම විමුක්තිය ලැබෙයි. එය ලක්ෂ්මී සහ නාරායනගේ රාජධානිය වූ කල්හි, ඔබ සිටියේ දිව්‍ය ලෝකයේය ඉතිරි සියලු දෙනාම සිටියේ විමුක්ති දේශයේය. අපි දැන් පියා සමඟ රාජයෝගාව හදාරනවා. පියා පවසන්නේ මා ඔබට කල්පයන්ගේ සංගමයෙදී උගන්වනවා. මා ඔබව මනුෂ්‍යයන්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය කරනවා. මා ඔය දරුවන්ට සියලුම රහස් විස්තර කර දෙනවා. එය ශිව රාත්‍රිය වූයේ කවදාද, එමෙන්ම ශිව බාබා පැමිණි විට සිදු වූයේ කුමක්ද කියා ඔබ දැන සිටිය යුතුයි. මිනිසුන් කිසිම දෙයක් නොදනී. එබැවින් ඔවුන් ගල් බුද්ධි ඇති අයයි. ඔබ දැන් දිව්‍යමය බුද්ධි ඇති අය බවට පත්වනවා. භාරතයේ, ස්වර්ණමය යුගය වූ කල්හි, එහි සිටි සියලු දෙනාටම දිව්‍යමය බුද්ධියක් තිබුණා. ලක්ෂ්මී සහ නාරායන, දෙවඟනක් සහ දේවතාවක් ලෙසින් හැඳින්වෙයි. පරමාත්ම දෙවියන් ඔවුන්ට උරුමය ලබා දුන් අතර, ඔහු එය දැන් ඔවුන්ට ලබා දෙනවා. ඔහු නැවත වරක් ඔබව දේවතාවන් සහ දෙවඟනන් බවට පත් කරවනවා. මෙය දැන් ඔබගේ බොහෝ උපත් වල අවසන් උපතයි. පරම පියා පවසන්නේ විනාශය අත ළඟයි. මෙයට, රුද්‍රාගේ දැනුමේ යාගහෝමය යැයි කියයි. ඒ සියලුම යාග හෝම භෞතිකයි (ලෞකික දේවල් වෙනුවෙන් සිදු කරන භෞතික යාගහෝම). මෙය දැනුම පිළිබඳ කාරණාවකි. පරම පියා පැමිණ මෙම යාගහෝමයේදී මනුෂ්‍යයන්ව, දේවතාවන් බවට පරිවර්ථනය කරයි. ඔහු පැමිණි විට, ඔබ ශිව බාබට සුබ පැතුම් ලබා දෙයි. එවිට බාබා පවසන්නේ මා තනිව පැමිණෙන්නේ නැහැ. මටද සිරුරක් අවශ්‍යයි. මා බ්‍රහ්මගේ සිරුරට ඇතුළු විය යුතුයි. සූක්ෂම කලාපය නිර්මාණය කළ යුතුයි. මා ඔහු තුළට ඇතුළු වූයේ ඒ නිසයි. ඔහු අපවිත්‍රයි. ඔහු අපවිත්‍ර වූයේ උපත් 84 ක් ගැනීමෙන්ය. සෑම කෙනෙක්ම කන්නලව් කරනවා. පියා පවසන්නේ මා දැන් නැවත වරක් පැමිණ ඇත්තේ ඔය දරුවන්ට ඔබගේ උරුමය ලබා දීමටයි. භාරතයට දිව්‍ය ලෝකයේ උරුමය ලබා දෙන්නේ පරම පියා පමණයි. දිව්‍ය ලෝකයේ නිර්මාණකරු, පරමාත්ම පියාය. අනාගත උපත් 21 ට මනුෂ්‍යයන්ට, දේවතාවන් බවට පත් වීමට ඇති පාසැල මෙයයි. ඔබ දිව්‍ය ලෝකයේ අධිපතියන් බවට පත් වනවා. ඔබ පරම්පරා 21 කට සතුට ලබා ගන්නවා. එහි අකල් මරණ නොමැත. ඔබගේ සිරුරේ ආයුෂ කාලය අවසන් වන විට, ඔබගේ සිරුර හළා, වෙනත් එකක් ගැනීමේ දර්ශනයක් ඔබට ලැබෙයි. සර්පයාගේ නිදසුන ඇත. ඔය දරුවන් පියාට සුබ පැතුම් ලබා දෙන අතර, පියා ඔබට ආපසු සුබ පැතුම් දෙයි. අභාග්‍යසම්පන්නව සිට, ඔබ දැන් බොහෝ සේ භාග්‍යසම්පන්න වනවා. ඔබ අපවිත්‍ර මනුෂ්‍යයන්ගෙන්, පිවිතුරු දේවතාවන් බවට පරිවර්ථනය වනවා. චක්‍රය අඛණ්ඩව භ්‍රමණය වනවා. ඔය දරුවන් මෙම දැනුම විස්තර කළ යුතුයි. ඉන්පසුව එය අතුරුදහන් වෙයි ස්වර්ණමය යුගයෙදී දැනුම සඳහා අවශ්‍යතාවයක් නොතිබෙනු ඇත. ඔබ දැන් සිටින්නේ පහත් තත්ත්වයකයි, ඒ නිසයි ඔබට මෙම දැනුම තුළින් විමුක්තිය ලැබෙන්නේ. පැමිණ, දිව්‍ය ලෝකය ස්ථාපිත කරන්නේ පරමාත්ම පියා පමණයි. සෑම කෙනෙකුටම සිටින්නේ එක් සත්ගුරු කෙනෙක් පමණයි. භක්ති මාර්ගයේ ඇති කිසිම භෞතික පූජා ක්‍රමයක් මගින්, කිසිම කෙනෙකුට විමුක්තිය ලබාගත නොහැක. සෑම කෙනෙක්ම ඉනිමඟ දිගේ පහළට පැමිණිය යුතුයි. භාරතය මුලදී සතෝප්‍රධාන්ව පැවතුණි. ඉන්පසුව ඔබ උපත් 84 ක් ගත යුතුව තිබූ අතර ඔබ දැන් ඉහළ නැඟිය යුතුයි. ඔබ ආපසු විමුක්ති දේශයේ නිවහනට යා යුතුයි. නාට්‍යය දැන් අවසන් වනවා මෙම පැරණි ලෝකය විනාශ වීමට යනවා. භාරතයට, අවිනාශී දේශය යැයි කියයි. පියාගේ උපත් ස්ථානය, කිසිදා විනාශ වන්නේ නැත. ඔබ සාම දේශයට ගොස්, ඉන්පසුව මෙහි පැමිණ, නැවතත් පාලනය කරනු ඇත. පිවිතුරු සහ අපවිත්‍ර අය සිටින්නේ භාරතයේ පමණයි. ඔබ උපත් 84 ක් ගැනීමේදී අපවිත්‍ර වී ඇත. යෝගීන්ව සිට, ඔබ භෝගීන් (ඉන්ද්‍රියන් පිනවන අය) බවට පත්වූවා. මෙය අපායේ අන්ත අගාධයයි. මෙය මහා ශෝක සමයයි. තව ඉදිරියේදී මීටත් වඩා දුක් ඇති වීමටයි යන්නේ හේතුවක්

නොමැතිව ලේ ගැලීම් සිදුවෙයි. කොහේ හෝ ස්ථානයක අසුන්ගෙන සිටින මිනිසුන් මත බෝම්බ හෙලයි. ඔවුන් සිදුකළ අපරාධය කුමක්ද? හේතුවක් නැතිව සෑම කෙනෙක්ම විනාශ වනු ඇත. විනාශය පිළිබඳ දර්ශන, දරුවන්ට ලැබී ඇත. ඔබට දැන් ලෝක චක්‍රය ගැන දැනුම තිබේ. ඔබ සෑම කෙනෙකුටම දැනුමේ අසිපතක් ඇත. බ්‍රහ්මගේ මුඛයෙන් උපන් නිර්මාණය ඔබයි. ප්‍රජාපිතාද බාබාය. ඔහු පෙර කල්පයේද මුඛයෙන් උපන් නිර්මාණය බිහි කළේය. පරම පියා පවසන්නේ මා සෑම චක්‍රයකදීම පැමිණෙන්නෙමි. මා මෙම කෙනා තුළට ඇතුළු වී මුඛයෙන් උපන් ඔය නිර්මාණය, බිහි කරන්නෙමි. මා බ්‍රහ්මගේ මාර්ගයෙන් දිව්‍ය ලෝකයේ ස්ථාපනය සිදු කරනවා. ඔබ දිව්‍ය ලෝකයට යන්නේ අනාගතයේදී පමණයි පළමුව, අපිරිසිඳු ලෝකය විනාශ විය යුතුයි. ලෝකය අළුත් කිරීමට අසීමිත පියා පැමිණෙයි. පියා පවසන්නේ මා ඔය දරුවන් වෙනුවෙන්, මගේ අත්ල මත දිව්‍ය ලෝකය ගෙනැවිත් තිබේ. මා ඔබට කිසිම අපහසුතාවයක් සිදු කරන්නේ නැත. ඔබ සැවොම ද්‍රෞපදීන්ය. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණු දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ, දේවතාවන්ටත් වඩා ශ්‍රේෂ්ඨ, වඩාත් උසස් බ්‍රහ්මණයන්ය, යන කුල්මත්භාවය පවත්වා ගන්න. දැනුම සහ යෝගාවෙන් ජීවය, පිරිසිඳු කරගන්න.
2. ශිවාගේ අවතරණය වෙනුවෙන් සෑම කෙනෙකුටම සුබ පැතුම් ලබා දෙන්න. සෑම කෙනෙකුටම පියාගේ හැඳින්වීම ලබා දී, අපවිත්‍ර අයව පිවිතුරු කරවන්න. සතුරා වන රාවණගෙන් සියල්ලන්ව මුදවගන්න.

**වරදානය:** වර්ණවත් දේවල සියලු ප්‍රසාරණයෙන් ඉවත් වී පහසු යෝගීවරයෙකු මෙන් දුෂ්කර දේ පහසු කරත්වා.

ඔබ සියලු බාහිර සිදුවීම් දෙස බැලීමට පටන් ගත් විට, පරම පියා දෙස බැලීම වෙනුවට, බොහෝ ප්‍රශ්න මතු විය හැකිය. එවිට ඔබට පහසුවෙන් අත්විඳිය හැකි දේ දුෂ්කර වීමට පටන් ගනී, මන්ද සිදුවීම් ගස වන අතර පරම පියා බීජයයි. ප්‍රසාරණයේ ගස තම අත්ල මත තබාගෙන සිටින අය පියා පසෙකට දමති, එවිට ප්‍රසාරණය ඔවුන් සිරවී සිටින උගුලක් බවට පත්වේ. සිදුවීම් ප්‍රසාරණය කිරීමේ දී ඔබව ආකර්ෂණය කර ගැනීම සඳහා බොහෝ වර්ණවත් දේවල් තිබේ. එබැවින්, බීජය වන පරම පියා සිහිපත් කර, සම්පූර්ණ නැවතුමක් තබා සියල්ලෙන් ඉවත් වූ විට, ඔබ පහසු යෝගීවරයෙකු වනු ඇත.

**පාඨය:** "මම" සහ "මගේ" මිශ්‍ර ලෝහය අවසන් කිරීම යනු සැබෑ රත්රන් වීමයි.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න.**

දැන්, සෑම කෙනෙකුම එකට එකතු වී, එක්සත් වී, බොහෝ තේජසින් යුතුව ඕනෑම සේවා කාර්යයක් ඉදිරියට ගෙන යමු. සෑම බ්‍රාහ්මණ ජීවාත්මයක්ම සහයෝගයෙන්, සුබ පැතුම් සහ පිරිසිදු හැඟීම් ඇතිව, සේවයේ තේජසක් ඇති කර ගන්න. යමෙකුට වචන වලින් කතා කිරීමට නොහැකි නම්, ඔහුට තම මනසේ ආකල්පයෙන් සතුටු වාතාවරණයක් නිර්මාණය කළ හැකි අතර, ඔහුගේ සතුටේ අවධියෙන් සතුටු ලෝකයක් නිර්මාණය කළ හැකිය. ඔබට කොහේවත් යාමට නොහැකි නම්, ඔබේ සෞඛ්‍යය යහපත් නොවේ නම්, ඔබට නිවසේ වාඩි වී සේවය කළ හැකිය. නිසැකවම සේවයේ සහයෝගයෙන් සිටින්න, එවිට පමණක් ඔබට සෑම කෙනෙකුගේම සහයෝගයෙන් සතුටු ලෝකයක් නිර්මාණය කිරීමට හැකි වනු ඇත.